# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ලිඛිත නියෝජන (අදහස්)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳව ස්වකීය අදහස් ලිඛිතව ඉදිරිපත් කිරීමට සමිති /සංවිධාන, දේශපාලන පක්ෂ හා වෘත්තීය සංවිධාන වෙත ලබාදුන් කාලය 2016 මැයි මස 31 වැනි දින තෙක් දීර්ඝ කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව තීරණය කර ඇත.

පහත දැක්වෙන මාතෘකා යටතේ ලිඛිත නියෝජනයන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

1. රාජ්‍යයේ ස්වභාවය, පරමාධිපත්‍යය, ආගම, රාජ්‍ය පාලන ක්‍රමය
2. මැතිවරණ ක්‍රමයේ සංශෝධන
3. බලය බෙදීමේ මූලධර්ම
4. ඉඩම්
5. මූලික අයිතිවාසිකම්:
    - මූලික අයිතිවාසිකම්, භාෂා අයිතිවාසිකම්, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම, පුරවැසිභාවය
6. අධිකරණය
    - අධිකරණය, උසාවි ව්‍යුහය, අධිකරණ සමාලෝචනය, මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලයද ඇතුළුව අධිකරණවල බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය
7. මුල්‍ය:
    - රාජ්‍ය මුල්‍යය, පළාත් මුල්‍යය, පොදු ව්‍යාපාර, මහ බැංකුව
8. නීතිය හා සාමය:
    - නීතිය හා සාමය, රාජ්‍ය ආරක්ෂාව, හදිසි අවස්ථා නීතිය (හදිසි නීති තත්ත්වය)
9. රාජ්‍ය සේවය:
    - රාජ්‍ය සේවය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් රාජ්‍ය සේවය, පළාත් පාලන සේවය, මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළුව ස්වාධීන කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)
10. මධ්‍යම රජය හා පළාත් අතර සබඳතාවය:
    - මධ්‍යම රජය හා පළාත් සභා අතර සබඳතාවය, පළාත් පාලන ආයතන, පළාත් විධායකය, මධ්‍යම රජයේ හැකියා, පළාත් හා පළාත් පාලන ආයතන, පරිපාලන ව්‍යුහය (දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්)

ඉහත දැක්වෙන එක් එක් මාතෘකාව යටතේ වන ඉදිරිපත් කිරීම වෙන වෙනම ලේඛන සේ පිළියෙල කර මාතෘකාව පළමුවැනි පිටුවේ පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

❖ මෙලෙස අදහස් ඉදිරිපත් කිරීම් 2016 මැයි මස 31 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ලේකම්<br>
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුව<br>
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව<br>
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

❖ නැතහොත් "www.parliament.lk"යන වෙබ් අඩවිය ඔස්සේ විද්‍යුත් තැපැල මගින් ඉදිරිපත් කළ හැකිය.

*නීල් ඉද්දවල*<br>
*ලේකම්*<br>
*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුව*